# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2162/40 - 2020 පෙබරවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: AKU/LAN/06/ACQVI89.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/5/2018/එච්ජ්/01.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන වන ඉඩම/පරවශ්‍යතාවේ විස්තර*:

මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළය උතුර අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාණික්කගොඩ ගමේ පිහිටි මාතර සර්වේයර් ජනරාල්ගේ අ.ග.පි. 552 අතිරේක අංක 4 දරන අවසාන ගම් පිඹුරේ පෙන්නුම් කරන පහත දක්වෙන ඉඩම:

**කැබලි අංකය 285 - ඉඩමේ නම: කනත්තෙගෙදරවත්ත, පන්සලදෙනිය; ප්‍රමාණය: හෙක්**. 0.0177.

*උතුරට*: කැබලි අංක 14B; *නැගෙනහිරට*: කැබලි අංක 14B; *දකුණට*: කැබලි අංක 14B; *බටහිරට*: කැබලි අංක 14B.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 මාර්තු මස 05 වැනි දින පෙ. ව. 10.00 ට අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2020 පෙබරවාරි මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් සම්බන්ධයෙන් වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා එම වන්දි මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියළු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතුය.

ඕ. වී. චන්දන තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2020 පෙබරවාරි මස 10 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 589


1A - G 32016 - 15 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.